# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2093/45 – 2018 ඔක්තෝබර් 20 වැනි සෙනසුරාදා – 2018.10.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

33 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය : ජීසීඑෆ්/ඒටීඑච්/එන්ජී/08/එල්ආර්.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ
අමාත්‍යාංශයේ යොමු අංකය : 03/ජේ91/එල්ආර්බී/91.

මහ කොළඹ ගංවතුර පාලනය කිරීමේ හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ 1991.10.23 වැනි දින ප්‍රසිද්ධ කරන ලද අංක 685/6 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1991 අංක 144 දරන 38 (අ) අතුරු විධාන ආඥාව මගින් රජයට පවරාගෙන ඇති මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක 7948 දරන මූලික පිඹුරට ඇතුළත් කැබලි අංක 28 න් පහත උපලේඛනයේ විස්තර කර ඇති හිමිකම් සනාථ නොවූ ඉඩම් කොටස සඳහා ගෙවිය යුතු වන්දි මුදල ඉඩම් අත්කර ගැනීමේ පනතේ 33 වන වගන්තිය යටතේ නුගේගොඩ දිසා අධිකරණයේ තැන්පත් කර ඇති බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

පහත ඉඩම් කොටසට හිමිකම් කියන අය වෙතොත් තම හිමිකම් නුගේගොඩ දිසා අධිකරණය වෙත ඉදිරිපත් කර තමන්ට හිමි වන්දි මුදල ලබා ගන්නා ලෙස මහජනයාට මෙයින් නිවේදනය කරමි.

සී. ඩබ්ලිව්. අබේසූරිය,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.

2018 ඔක්තෝබර් මස 19 වැනි දින.
මහ කොළඹ ගංවතුර පාලනය කිරීමේ ව්‍යාපෘතිය,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය,
ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර පාර,
වැලිකඩ,
රාජගිරිය.

### උපලේඛනය

| | | |
|---|---|---|
| 01. | පළාත | : බස්නාහිර |
| 02. | දිස්ත්‍රික්කය | : කොළඹ |
| 03. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | : ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ |
| 04. | ගම | : නාවල ගමේ කොට්ඨාස අංක 04, නාවල (ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ) |
| 05. | ඉඩමේ නම | : දෙල්ගහ කුඹුර, මදටිය කුඹුර, පන්විල කුඹුර, වැටකෙයියා කුඹුර, තුම්මෝදර කුඹුර, දියවන්නා කුඹුර |
| 06. | මූලික පිඹුරු අංකය | : 7948 |
| 07. | කැබලි අංකය | : 28 |
| 08. | ප්‍රමාණය | : පර්. 5561.09 |
| 09. | දිසා අධිකරණය | : නුගේගොඩ |
| 10. | නඩු අංකය | : එම්/548/08 |
| 11. | තැන්පත් කරන ලද මුදල | : රු. 1,94,55,918.26 |
| | | : (රුපියල් එකසිය අනූ හතර ලක්ෂ පනස් පන්දහස් නවසිය දහ අටයි ශත විසි හයක් පමණි). |

11 - 273